වාර්ෂික වාර්තාව -2020
ஆண்டறிக்கை -2020
Annual Report -2020

හෝමියෝපති වෛද්‍ය සභාව
ஹோமியோபதி மருத்துவ சபை
Homoeopathic Medical Council

දේශීය වෙදකම් ප්‍රවර්ධන,ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

சுதேச வைத்திய முறைகள் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும்
சமூகச் சுகாதார இராஜாங்க அமைச்சு

State Ministry of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health

පටුන

පිටුව

1. සාරාංශය 02

2. හැඳින්වීම 03

3. හෝමියෝපති වෛද්‍ය සභාව 04

4. පසුබිම් විස්තරය 05

5. වෛද්‍ය සභාවේ අරමුණු 07

6. වෛද්‍ය සභාව සතු බලතල 08

7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධුර කාලය 10

8. සංස්ථාපිත තොරතුරු 11

9. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය 12

10. වාර්ෂික ගිණුම් වාර්තා

11. විගණන වාර්තාව

12. සුභාසිංශන

01. සාරාංශය

2020 වසර තුළ හෝමියෝපති වෛද්‍ය සභාවේ සමස්ත ක්‍රියාකාරීත්වයට අදාළව සකස් කරන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කෙරේ.

මෙම වසරේදී හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පිහිටවනු ලැබූ ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාව විසිනි. සභාවේ ගිණුම් කටයුතු රේඛීය අමාත්‍යාංශය වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය විසින් මෙහෙය වනු ලැබීය.

වෛද්‍ය සභාව මඟින් පවත්වා ගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන 12 හි පුරප්පාඩුව පැවති කාර්යාල සහයක තනතුරු 12 සඳහා බඳවා ගනිමින් වෛද්‍ය සභාවේ ආයතනික ව්‍යුහය ශක්තිමත්ව පුළුල් කිරීමට පසුගිය වසරේ දී ක්‍රියා කරනු ලැබීය. හෝමියෝපති උපාධිධාරී නව වෛද්‍යවරුන් දහතුන් දෙනෙකුට ලියාපදිංචිය ලබා දී මෙතෙක් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 303 දක්වා වර්ධනය කර ගන්නා ලදී. පනතේ 30 (1) වගන්තිය ප්‍රකාරව වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වන විභාගය වෙනුවෙන් අයදුම්පත් කැඳවා ඇති අතර 189 දෙනෙක් අයදුම්පත් යොමුකර තිබුණි.

02. හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය සුවපත් කිරීම ” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩරික් හානිමාන් විසිනි. අද වන විට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. මේ වන විට ලොව පුරා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, ලොව පුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන ද බිහි කරමින් පවතින බව සඳහන් කල යුතුය.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මඟින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාර ධුර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැගි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජයගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටුකිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස ගැනිය හැකි හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේදී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහිලා එහි කාර්යභාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 12 ක රජයේ හෝමියෝපති සායන 12 ක් ස්ථාපිත කර තිබුණි. පැවති සායන 7ට අමතරව කොත්මලේ, අම්බලන්තොට, පුත්තලම, මඩකලපුව හා ඉංගිරිය යන රජයේ හෝමියෝපති සායන පෙර වසරේ අභිනවයෙන් ආරම්භ කරනු ලැබූ ස්ථාන විය.

පසුගිය වසරේ දී වෛද්‍ය සභාව විසින් මෙහෙයවන රජයේ හෝමියෝපති සායන සංඛ්‍යාව 12ක් දක්වා වර්ධනය කිරීමට හැකි වූ අතර ඒ අනුව කාර්ය මණ්ඩලයටද නව තනතුරු 10කට බඳවා ගැනීමට හැකි විය. තව ද මෙම වසරේ දී අළුතින් දිස්ත්‍රික්ක දෙකක එනම් ගාල්ල හා පොළොන්නරුව යන ස්ථාන වල නව සායන දෙකක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සැකසීමට නව වෛද්‍ය සභාව විසින් තීරණය කරන ලදී.

03.හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

‘‘හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම’’

මෙහෙවර

‘‘හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.’’

පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධානවලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

04.පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. ප්‍රථම වෛද්‍ය සභාව **හෝමියෝපති අතුරුවෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් නම් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ඡන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග

1. හෝමියෝපති රෙගුලාසි - 1980

(වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම.

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේදී විෂයභාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත්කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි.

1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්,තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන් වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිම වීමට පෙර විෂය භාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මග හැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජූලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරුපාලක කමිටුවට ලැබුණි.

හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබාදී ඇති බලතලවලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකුණි. ඒ අනුව පනත සඳහා වන රෙගුලාසි, වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා වන රෙගුලාසි, හෝමියෝපති ඖෂධ ආනයනය, බෙදාහැරීම, නිෂ්පාදනය සඳහා වන රෙගුලාසි, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා වන රෙගුලාසි, සහ පනතේ 30 වගන්තිය අනුව පැවැත්විය යුතු විභාගය සඳහා වන රෙගුලාසි සඳහා වන කෙටුම්පත් සකස් කර සභාවේ සම්මත කර ගෙන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව මෙම වෛද්‍ය සභාවේ සභාපතිවරයා වූ වෛද්‍ය චන්දන වීරසේකර මහතා විසින් හෝමියෝපති දෙපාර්තමේන්තුවක් සඳහා වන කෙටුම්පතක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018 වසරේ ඔක්තෝබර් 19 දිනෙන් අවසන් විය.

05.වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි,

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම.
2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.
3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම.
4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වාගෙන යාම.
5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබා දෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම.
6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩාකිරීම, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම.

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම.

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම.

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම.

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම.

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය.

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම.

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම.

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම.

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම.

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම.

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම.

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම.

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

07.වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධුර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ජන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකුද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම් /ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

08.සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	:-	හෝමියෝපති වෛද්‍ය සභාව
ලිපිනය	:-	අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.
දුරකතන අංකය	:-	011-2958175
ෆැක්ස්	:-	011-2958175
විද්‍යුත් තැපෑල		homosri.mcouncil@gmail.com
සංස්ථාපිත ආයතනයේ තත්ත්වය	:-	2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15, 16 හා17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභා වස්ථාපිත කර ඇත.
පරිපාලන ව්‍යුහය	:-	ලේකම් / ලේඛකාධිකාරී කාර්යභාර වෛද්‍යවරු කළමනාකරණ සහකාර ඖෂධසංයෝජක කාර්යාල සහායක
බැංකුකරුවෝ	:-	ලංකා බැංකුව - තැප්‍රොබේන්ශාඛාව, කොළඹ කොමර්ෂල් බැංකුව - ජාඇල

09. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය

2020.01.01 – 2020.12.31

පසුගිය වසර මෙන් 2020 වසර ද ආරම්භ වූයේ හෝමියෝපති වෛද්‍ය සභාවක් පත් කෙරී නොමැති තත්ත්වයක සිට සහ පැවති සභාව මඟින් අනුමත කර තිබූ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යන්නා වූ හෝමියෝපති සේවාවන්ට සීමා වෙමිනි. එමෙන්ම පෙර වසරේ දී පරිදිම, වෛද්‍ය සභාවේ කාර්යයන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශයේ සම්පූර්ණ අධීක්ෂණය සහ අනුමැතියට යටත්ව මෙම වසරේ මුල් මාස 06 තුළ ඉටු කෙරුණි. සැප්තැම්බර් 09 වෙනි දින සිට ගරු අමාත්‍යතුමා විසින් හෝමියෝපති නව වෛද්‍ය සභාවක් පත් කරන තෙක්ම වෛද්‍ය සභාවේ කටයුතු මෙලෙස කළමනාකරණය විය.

2020 වසර යථා පරිදි හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මනා කළමනාකරණයක් යටතේ පවත්වා ගෙන යාමට හැකි වූ වසරක් නොවීය. 2020.03.17 දින සිට 2020.05.11 දක්වා කොවිඩ් වසංගතය හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය වසා තැබීමත් වසර අවසානය දක්වාම මෙම දිස්ත්‍රික්කයේ පොදු ප්‍රවාහනය ඇතුලු විවිධ සේවාවන්ගේ සිදු කෙරුණු සීමා කිරීම් වෛද්‍ය සභා කාර්යාලයේ කටයුතු අඩපන වීමට විශේෂයෙන්ම හේතු විය. දැඩි කාර්ය මණ්ඩල හිඟයක් යටතේ අසිරුවෙන් පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සභා කාර්යාල කාර්ය මණ්ඩලයේ පැමිණීමද සීමා වූ තත්ත්වයක් නිර්මාණය වීම අපේක්ෂිත කාර්ය සාධනයන් කරා ළඟා වීමට උත්සාහ දැරීමට පවා අසිරු තත්ත්වයක් උදා කළේ ය.

1. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය හා කළමනාකරණය

1.1 රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය.

සායන වල කාර්ය සාධනය සම්බන්ධයෙන් ද කොවිඩ් 19 වසංගතය බලපෑවේ පෙර පැවති වර්ධන මට්ටම බිඳ දමන ආකාරයෙනි. මෙහි දී රජය මඟින් ම දිනකට පරීක්ෂා කෙරෙන රෝගීන්ගේ සංඛ්‍යාව සීමා කරන ලදී. අනෙක් අතට ඉතාම අසිරු තත්ත්වක් යටතේ පමණක් සායන කරා පැමිණෙන ප්‍රවනතාවක් රොගීන් තුළින්ම නිර්මාණය විය.

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 12 මඟින් මෙම වසර තුළ ප්‍රතිකාර ගත් රෝගීන් ප්‍රමාණ පහත පරිදි වේ.

අනු අංක	සායනය	ප්‍රතිකාර ගත් රෝගීන් සංඛ්‍යාව
1	දෙහිවල	7,633
2	තෝලංගමුව	5,946
3	පරකඩුව	6,354
4	කුරුණෑගල	7,644
5	කොත්මලේ	7,331
6	මොණරාගල	5,862
7	පාලමුණෙ	3,883
8	පුත්තලම	3,897
9	මාතලේ	7,644
10	අම්බලන්තොට	3,150
11	මඩකලපුව	3,635
12	ඉංගිරිය	2,313
	එකතුව	65,292

1.2 රජයේ හෝමියෝපති සායන කළමනාකරණය.

රජයේ හෝමියෝපති සායන කළමනාකරණය කරනු ලබන්නේ හෝමියෝපති වෛද්‍ය සභාව විසිනි. ඒ අනුව 2020 වසර පුරා ද ඒ වෙනුවෙන් ක්‍රියා කරන ලදී. ඒ යටතේ සේවක වැටුප් හා දීමනා ලබා දීම, ආයතන වල කාර්ය මණ්ඩල පරිපාලනය, සායන වලට ජලය, විදුලිය හා සනීපාරක්ෂක සේවා සැපයීම, සායන උපකරණ , බෙහෙත් හා කාර්යාල උපකරණ ලබා දීම පමණක් නොව ගොඩනැගිලි නඩත්තුව සඳහාද ක්‍රියා කරනු ලැබේ.

සායන සඳහා ලබා දීමට ඇනවුම් කර තිබූ බෙහෙත් තොග ලැබීම විවිධ හේතු මත කල් යාමත්, අවසානයේ කොවිඩ් - 19 වසංගතය නිසා බෙහෙත් ආනයනය කිරීමට නොහැකි වීමත් මත අමාත්‍යාංශය විසින් දේශීය වෙළඳ පොළෙන් බෙහෙත් මිල දී ගැනීමට තීරණය කරන ලදී.

මේ අනුව හෝමියෝපති ඖෂධ ලබා දීමට යොදා ගන්නා ග්ලොබියුල්ස් දේශීය වෙළඳ පොළෙන් දෙවරක්ම මිල දී ගෙන සායන වෙත ලබා දීමට කටයුතු කෙරිණි.

බෙහෙත් මිල දී ගැනීම සඳහාද දේශීය වෙළඳ පොළෙන් මිල ගණන් කැඳවා, අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග කිහිපයක් සහ ග්ලොබියුල්ස් යම් ප්‍රමාණයක් මිල දී ගන්නා ලදී.

වාර්ෂිකව සායන වලට ලබා දිය යුතු බෙහෙත් ලංකාවට නොලැබීම නිසා සායන පවත්වා ගෙන යනු ලැබුවේ උග්‍ර බෙහෙත් හිඟයක් මධ්‍යයේ ය. වසර අවසානය වන විට ආයනික බෙහෙත් ලංකාවට ලැබී තිබෙන බවට වාර්තා විය.

2. හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් සංවිධානය කෙරෙන හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම හෝමියෝපතිවෛද්‍ය සභාව වාර්ෂිකව සිදු කරන ප්‍රධාන කාර්යයක් වේ. එහෙත් මෙම වසර ආරම්භයේ පටන් ලාංකීය සමාජයට මුහුණ දෙන්නට සිදු වූ කොවිඩ් - 19 වසංගතය නිසා ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා මහජනයා රැස් කර ජංගම සායන පැවැත්වීම සෞඛ්‍යාරක්ෂිතව සිදු කිරීම අසීරු තත්ත්වයකට පත් විය. එහෙයින් මෙම වසරේදී ජංගම සායන හා සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කෙරුණේ ඉතාමත් අල්ප වශයෙන් බව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. මේ අනුව පහත සඳහන් සම්මන්ත්‍රණ හා ජංගම සායන පරකඩුව රජයේ හෝමියෝපති සායනය සහ අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් සහ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

මෙහෙය වීම	ස්ථානය	වැඩසටහන	සහභාගිකයින් ගණන
1. පරකඩුව රජයේ හෝමියෝපති සායනය	ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය - 2020.02.22	හෝමියෝපති සම්මන්ත්‍රණය හා සායනය	201
2. පරකඩුව රජයේ හෝමියෝපති සායනය	බටුගෙදර මධ්‍ය මහා විද්‍යාලය, රත්නපුරය. 2020.02.29	හෝමියෝපති සම්මන්ත්‍රණය හා සායනය	56

03. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හඳුන්වා දීම හා ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය වැඩසටහන්.

පුවත් පත් ලිපි

01 ඉසිවර පුවත් පත

- 2020 ජනවාරි කලාපය - ඔස්ටියෝ ආතරයිටිස් නිසා පාද ඇඳයෙන් පීඩා විඳින ඔබට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 පෙබරවාරි කලාපය - හෘද රෝග වලට නිසැක සුව ගෙන දෙන හෝමියෝපති ප්‍රතිකාර

- 2020 මාර්තු තලාපය - සම අවලස්සන කරන ඉන්නන්ට තිත තබනහෝමියෝපති ප්‍රතිකාර
- 2020 ජූලි කලාපය - හෘද රෝග වලට නිසැක සුවය ගෙන දෙන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 අගෝස්තු කලාපය - Covid - 19 වැනි වසංගත රෝග වලට ප්‍රතිශක්තිකරණය ගොඩනංවන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 සැප්තැම්බර් කලාපය - පොතු කබර රෝගයට නිසැක සුවය ගෙන දෙන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 ඔක්තෝම්බර් කලාපය - වේදනාකාරී සෙලියුලයිටිස් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 නොවැම්බර් කලාපය - පාකින්සන් රෝගයට පුනර්ජීවය
- 2020 දෙසැම්බර් කලාපය - දියවැඩියාව මට්ටු කරන හෝමියෝපති ප්‍රතිකාර

02. තරුණි පුවත් පත

- 2020 ජනවාරි කලාපය - හිරිවැටීම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 පෙබරවාරි කලාපය - දියවැඩියාවට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 ජූනි කලාපය - සන්ධි වේදනාවෙන් පීඩා විඳින වියපත් ඔබට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 සැප්තැම්බර් කලාපය - කොන්ද වේදනාව, කැක්කුම ඇති වැඩිහිටි ඔබට සුවය
- 2020 ඔක්තෝබර් කලාපය - හෝමියෝපති ප්‍රතිකාර මඟින් ප්‍රතිශක්තියට බලපෑමක් කළ හැකි ද?

03. දිවයින (සඳුදා)

- 2020.01.13 - ඩෙංගු රෝගයට හෝමියෝපති පිළියම්
- 2020.02.10 - කොන්දේ අමාරුවට කොතරම් ප්‍රතිකාර කළත් පලක් නැතිද?
- 2020.03.16 - ඔබත් පාද ඇදයෙන් පීඩා විඳිනවාද?
- 2020.05.04 - ඩෙංගු සුවපත් කරන හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර

- 2020.06.15 - Covid-19 වැනි වසංගත රෝග වලට ප්‍රතිශක්තිකරණය ගොඩනංවන ප්‍රතිකාර
- 2020.07.20 - වියපත් වූ ඔබ සන්ධි වේදනාවෙන් පීඩා විඳිනවාද?
- 2020.09.14 - සම අවලස්සන කරන පොතු කබර රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2020.10.12 - Covid-19 වැනි වසංගත රෝග වලට හෝමියෝපති ප්‍රතිකාර
- 2020.11.18 - ජනපති පළමු පදවිප්‍රාප්තිය හා අගමැති ජක්ම දිනයට හෝමියෝපති සියලු වෛද්‍යවරුන්ගේ ප්‍රණාමය පුදකිරීමේ ලිපිය
- 2020.12.21 - පාකින්සන් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර මඟින් පුනර්ජීවනයක්

04. වෛද්‍යවරයා මාසික සඟරාව

- 2020 ජනවාරි කලාපය - හර්නියා සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 පෙබරවාරි කලාපය - බෙල්ලේ කැක්කුම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 මාර්තු කලාපය - කාන්තාවනි ඔස්ටියෝ ආතරයිටිස් නිසා පාද ඇදයෙන් පීඩා විඳින ඔබට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 අගෝස්තු කලාපය - හෘද රෝග වලට නිසැක සුව දෙන හෝමියෝපති
- 2020 සැප්තැම්බර් කලාපය - Covid-19 වසංගත රෝග වලට ප්‍රතිශක්තිකරණය ගොඩනංවන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 ඔක්තෝම්බර් කලාපය - හෝමියෝපති ප්‍රතිකාර මඟින් පොතු කබර නිට්ටාවටම සුව කර ගනිමු
- 2020නොවැම්බර් කලාපය - වේදනාකාරී සෙලියුලයිටිස් සුවකරන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 දෙසැම්බර් කලාපය - පාකින්සන් රෝගීන්ට නැවත ජීවිතයක් ලබා දෙන හෝමියෝපති ප්‍රතිකාර

05. සිරිකත පුවත් පත

- 2020 ජුනි කලාපය - සන්ධි වේදනාවෙන් පීඩා විඳින වියපත් ඔබට හෝමියෝපති
- 2020 ජුලි කලාපය - සයටිකා රෝග සුවයට හෝමියෝපති ප්‍රතිකාර

- 2020 අගෝස්තු කලාපය - පාකින්සන් රෝගී ජීවිත නැවත යථා තත්වයට පත් කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 සැප්තැම්බර් කලාපය - කොන්දේ වේදනාව, කැක්කුම ඇතිවන වැඩිහිටි ඔබට සුවය ගෙනෙන හෝමියෝපති ප්‍රතිකාර
- 2020 ඔක්තෝම්බර් කලාපය - හෝමියෝපති ප්‍රතිකාර මඟින් ප්‍රතිශක්තිකරණයට බලපෑමක් කළ හැකිද?
- 2020 නොවැම්බර් කලාපය - දියවැඩියාවට හෝමියෝපති ප්‍රතිකාර
- 2020 දෙසැම්බර් කලාපය - පාද හිරියට නිවැරදි විසඳුම

<u>ගුවන් විදුලි වැඩසටහන්</u>

V FM

- 2020 පෙබරවාරි 14 - හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්වීම.

<u>රූපවාහිනී වැඩසටහන්</u>

01. **ස්වර්ණවාහිනී**

- 2020.02.27 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

02. **ධර්ම ධම්ම TV**

- 2020.03.30 -හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුලින් කොරෝනා වෛරසය පාලනය කල හැකි ද?

4. හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

වෛද්‍ය සභාවක් පත් නොකෙරී පැවැති වසර 02ක පමණ කාලය තුළ නව වෛද්‍යවරුන් ලියාපදිංචිය ඇණ හිටී තිබුණි. නව වෛද්‍ය සභාව පත් වූ පසුව මෙම ගැටලුව විසඳාලීමට හැකියාව ලැබුණි. මේ අනුව හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන්15 දෙනෙකු ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබුණු අතර විදේශ ගත වීම් නිසා දෙදෙනෙකු ලියාපදිංචිය ලබා ගැනීම සඳහා නොපැමිණෙන බව දන්වා තිබුණි.

ඒ අනුව ඉතිරි 13 දෙනා වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කරන ලදී. මේ අනුව මෙරට ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 303 දක්වා වර්ධනය විය.

5. හෝමියෝපති බෙහෙත් ආනයනය සඳහා නිර්දේශ ලබා දීම.

හෝමියෝපති බෙහෙත් ආනයනය සඳහා වෛද්‍යවරුන් ඉදිරිපත් කළ ඇමරිකානු ඩොලර් 68,344.395ක් වටිනා ඉල්ලුම් පත් 16 කට සහ යුරෝ 1,435.53ක් වටිනා ඉල්ලුම් පත් දෙකකට තාක්ෂණික කමිටුවේ නිර්දේශය මත අනුමැතිය ලබා දී ඇත.

I.	Dr. W.D.N Leetus	-		**€ 1035.53**
II.	Dr. W.D.N Leetus	-	**$ 7014.22**	
III.	Dr. W.D.N Leetus	-	**$ 8166.18**	
IV.	Dr. S.P Pathirage	-	**$ 2923.60**	
V.	Dr. W.D.N Leetus	-	**$ 1399.72**	
VI.	Dr. W.D.N Leetus	-	**$ 1481.75**	
VII.	Dr. Anusha Priyangani	-		**€ 400.00**
VIII.	Dr. W.D.N Leetus	-	**$ 3153.50**	
IX.	Dr. N.H.S Manel	-	**$ 1175.08**	
X.	Dr. W.D.N Leetus	-	**$ 5461.60**	
XI.	Dr. W.D.N Leetus	-	**$ 5966.555**	
XII.	Dr. W.D.N Leetus	-	**$ 2900.00**	
XIII.	Dr. W.D.N Leetus	-	**$ 1621.60**	
XIV.	Dr. W.D.N Leetus	-	**$ 1599.76**	
XV.	Dr. W.D.N Leetus	-	**$ 2019.05**	
XVI.	Dr. W.D.N Leetus	-	**$ 2441.87**	
XVII.	State Pharmaceuticals Corporation of Sri Lanka	-	**$ 21019.91**	
	Total	=	**$ 68344.395**	**€ 1435.53**

6. නව සායන ආරම්භ කිරීම.

2016 වසරේදී අනුමත කරන ගන්නා ලද හෝමියෝපති වෛද්‍ය සභාවේ නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සඳහා නව සායන 02 ක් ආරම්භ කිරීමට අවශ්‍යව පැවතුණි. මේ සඳහා ගාල්ල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 2හි ස්ථාන හඳුනා ගෙන ඒවායෙහි ගොඩනැඟිලි සකස් කිරීමේ කාර්යයන් වෙත ද යොමුව තිබුණි. එහෙත් වෛද්‍ය සභාවක් පත් කෙරී නොතිබුණු තත්ත්වයක් යටතේ මෙම කාර්යයන්ද ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොපැවතුණි. එහෙත් නව වෛද්‍ය සභාව පත් වූ පසුව ගාල්ල දිස්ත්‍රික්කයේ රත්ගම ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය යටතේ එම ප්‍රදේශයේ සායනයක් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු සලසා ගන්නා ලදී. වසර අවසානය වන විට ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කෙරෙමින් පැවතුණි.

7. හෝමියෝපති වෛද්‍ය සභාව යලි පත් කිරීම.

2016 අංක 10 දරණ හෝමියෝපති පනත ප්‍රකාරව අතරමැදි වෛද්‍ය සභාව පත් කිරීමෙන් පසු පළමු නව හෝමියෝපති වෛද්‍ය සභාව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය ගරු රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා විසින් 2020.09.09 දින පත් කරන ලදී. ලියාපදිංචිය හෝමියෝපති වෛද්‍යවරුන්ගේ ජන්දයෙන් තෝරා ගන්නා ලද හෝමියෝපති වෛද්‍යවරුන් 05 දෙනෙකු නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකු සහ ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුලත් සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය සභාවක් වසර 03ක කාලයක් සඳහා මෙලෙස පත් කෙරුණි. මේ අනුව 2020 වසරේ හෝමියෝපති වෛද්‍ය සභාවේ සිදු වූ වැදගත්ම කාර්ය වූයේ අභිනව වෛද්‍ය සභාව පත් කිරීම වේ.

10. වාර්ෂික ගිණුම් වාර්තා

හෝමියෝපති වෛද්‍ය සභාව

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 8 දක්වා)
- 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 9 දක්වා)
- 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 7 දක්වා)
- 2020 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ වාර්තාව
- 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති(2009)අංක 01 ට අනුවය. එසේම එහි ''ස්වභාවය මත වියදම වර්ගීකරණය විදහාපෑම'' යන පරිදි ඉදිරිපත් කර ඇත. හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්ථන හා මූලධන වියදම සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනයන් සභාවට ලද ප්‍රධානයන් ලෙසත් එසේම එම ප්‍රධානයන්ගෙන් දරනු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

ක්ෂය සඳහා වෙන් කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

2020 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක්ෂය අනුපාතයකට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07(24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත.

2019 දෙසැම්බර් 31 දක්වා වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇති අතර එසේම වත්කම් වර්ෂයේ කුමන දිනයක ඉවත් කළද අදාළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

කෙසේ වෙතත් වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණය පිළිබඳව වර්ෂ 2020.02.23 දිනෙහි විගණකාධිපති වාර්තාවේ අංක 1.4.2 (ගිණුම්කරණ අඩු පාඩු) (ආ) ඡේදයෙහි දැක්වෙන විගනන නිරීක්ෂණයට අනුව 2020 වර්ෂයේ සිට ඉදිරියට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව 20 එනම් සභාවේ වත්කම් ක්ෂය කරනු ලබනුයේ වත්කම පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙනයාමෙන් පසුවය. එසේම වත්කමක් පොත් වලින් ඉවත් කිරීම කළ යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද කටයුතු කරනු ඇත.

පාරිතෝෂිත සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ අනුව 2020 වර්ෂය සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්/සේවකයින් 16 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.

හෝමියෝපති වෛද්‍ය සභාවේ

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමානදෑ	01	2601730	2511862
ඖෂධ බහාලුම් තොග ගිණුම		15801	-
ජංගම නොවන වත්කම්			
පිරියෙන උපකරණ	02	2522474	1871388
ගොඩනැගිලි පුනරුත්ථාපන		5407281	5407281
වෙනත් උපකරණ		1450	1450
		7931205	7280119
		10548736	9791981
මුලු වත්කම්			
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු දෑ	03	2317234	1135643
ජංගම නොවන බැරකම්		-	-
මුලු බැරකම්		2317234	1135643
ශුද්ධ වත්කම		8231502	8656338
		10548736	9791981
ශුද්ධ වත්කම/ස්කන්ධය			
ප්‍රාග්ධනය		2562144	2562144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන(සංචිත)		8388226	7502334
සමුච්චිත ඌනතා/අතරික්ත	(04)	(2688452)	(1377724)
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම		(30416)	(3041)6
		8231502	8656338

මෙම මූල්‍ය ප්‍රකාශනය , සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

ලේඛාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාව	සභාපති හෝමියෝපති වෛද්‍ය සභාව	කමිටු සාමාජික හෝමියෝපති වෛද්‍ය සභාව	සකස් කළේ කේ.එස්. පියසිරි විශ්‍රාමික ප්‍රධාන ගණකාධිකාරී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

Dr.D.M.Ashan Thilanka
President
Homoeopathic Medical Council

විස්තරය	2020 රු.	2019 රු.
සටහන 01		
මුදල් හා මුදලට සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1953157	1874489
ලංකා බැංකුව	452673	441473
ලංකා බැංකුව (රාජගිරිය)	195900	195900
	2601730	2511862
සටහන 02		
පිරියත හා උපකරණ		
පිරියත හා උපකරන (ගත් මිල)	4686042	3800150
අඩුකලා		
සමුච්චය ක්ෂය	(2163568)	(1928762)
	2522474	1871388
සටහන 03		
ගෙවිය යු.තු දෑ		
ගෙවිය යුතු විගනන ගාස්තු	151610	179010
ගෙවිය යුතු ගණකාධිකාරී ගාස්තු	42000	42000
ගෙවිය යුතු දුරකථන ගාස්තු	6835	3997
ගෙවිය යුතු විදුලිය ගාස්තු	5180	5386
ගෙවිය යුතු ජල ගාස්තු	14892	20292
ගෙවිය යුතු වැටුප් දීමනා	-	8500
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා	1997328	840650
ගෙවිය යුතු ගමන් වියදම්	36805	28691
ගෙවිය යුතු සායන වියදම්	17371	5117
ගෙවිය යුතු වරිපනම්	2000	2000
ගෙවිය යුතු පරිවර්තන ගාස්තු	2963	
ගෙවිය යුතු විවිධ වියදම්	40250	
	2317234	1135643
සටහන 04		
සමුච්චිත ඌනතා/අතිරික්තතා		
2020.1.1	(1377724)	(1377724)
අඩුකලා		
2019 වර්ෂයේ ඩප්පි කවර වියදම් වැඩියෙන් ගිණුම් ගත වීම නිවාරදි කලා	408651	
2020.12.31 දිනට ශේෂය	(969073))	
එකතුකලා		
2020 වර්ෂයකාර්ය සාධනයේ ඌනතා/අතිරික්ත	(1719379)	
	(2688452)	(1377724)

සටහන 05

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 01ට අනුවය.

සටහන 06

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ. 2020 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක ක්ෂය අනුපාතයකට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරන ප්‍රමිති අංක 7(24) පරිදි වත්කම්හි පිරිවැය මත ගිණුම්ගත කර ඇත.

[illegible]

2020 වර්ෂයේ සිට ඉදිරියට , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 69 ඡේදය ප්‍රකාරව එනම් සභාවේ වත්කම් කෂය කරනු ලබනුයේ වත්කම් පාවිච්චි කිරීමට සුදානම් ගෙන පසුවය. එසේම වත්කමක් පොත්වලින් ඉවත් කළ යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද කටයුතු කරනු ඇත.

සටහන 07

1988 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව වර්ෂ පහකට වැඩි සේවාකාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ අනුව 2020 වර්ෂය සඳහා එවැනි සුදුසුකම් ලැබූ නිලධාරීන් /සේවකයින් 16 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.

සටහන 08

මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාවට එරෙහිව ගරු අධිකරණයේ නඩු 06 විභාග වෙමින් පවතී.

(i). 7087/11/m අංක දරන , හෝමියෝපති වෛද්‍ය සභාව සහ එහි සාමාජිකයින් 06 දෙනෙකු චිත්තිකරුවන් කරමින් වෛද්‍ය නිමල් ගාමිණී විජේතුංග විසින් පවරා ඇති නඩුව, දෙහිවල සායනයේ ගරු සේවයේ යෙදෙමින් කටයුතු කළ ඔහුව සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන තුනක් ඉල්ලා පවරනු ලැබ ඇති මෙම නඩුව ගල්කිස්ස දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ii). 13953/ m අංක දරණ හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතුව සිටි (ස්ථිර පදනමින් නොවන) M.R.D සේරම් යන අය සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන දෙකක වන්දියක් ඉල්ලා මීගමුව දිසා අධිකරණයේ මෙම නඩුව පවරා ඇත.මෙය තවදුරටත් විභාග වෙමින් පවතී.

(iii). 31/52/2010 අංක දරණ වත්තල කම්කරු විනිශ්චය සභාවේ පනවා ඇති නඩුව , 13953/ m අංක දරණ නඩුවේ පැමිණිලිකරු විසින්ම එම නඩු නිමිත්ත මතම මෙම නඩුවද පවරා ඇත. මෙය තව දුරටත් විභාග වෙමින් පවතී.

(iv). 14318- m මීගමු දිසා අධිකරණය

2009 වසරේ එතෙක් පැවැති වෛද්‍ය විසුරුවා හැරීමෙන් පසුව පත් කෙරෙනු ලේඛණාධිකාරී සහ සිදු කෙරෙනු ලියා පදිංචි කිරීමේ බල රහික කරන ලෙස ඉල්ලා මෙම නඩුව පවරා ඇත්තේ වෛද්‍ය S.D.P පෙරේරා මයා විසිනි. මෙයද අවසන් වී නොමැත.

(v) CA/87/~~2013~~ 2023 හෝමියෝපති අතුරුපාලක කමිටුවට වෛද්‍ය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා පැවරූ නඩුවේ තීන්දුව ගරු අභියාචනාධිකරණය විසින් ලබා දුනි. එමගින් හෝමියෝපති අතුරු පාලක කමිටුව පත් කිරීම කැබිනට් අනුමැතියේ නියමයන්ට අනුකූලව සිදුකර නොමැති බව දක්වමින් ගරු අභියාචනාධිකරණය හෝමියෝපති අතුරුපාලක කමිටුවේ සියලු තීරණ අවලංගු කිරීමට නියෝග කරන ලදි.

මෙම නඩුවේ තීන්දුවට අදාළ ලියකියවිලි වල ඇතුලත් සියලු කරුණු සැළකිල්ලට නොගැනීම මත ලබා ඇති එකක් බවට දක්වමින් එයට එරෙහි තීන්දුවක් ඉල්ලා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත ,මෙම අභියාචනය විභාගයට ගැනීමට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත. නඩු අංකය Fc/CA/FCL/196/2019

හෝමියෝපති වෛද්‍ය සභාවේ
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම			
රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන		22482797	21273216
වෙනත් ආදායම	01	11200	20700
බැංකු පොලී		79018	91505
මුළු ආදායම		22573015	21385421
වියදම			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	02	21410642	19682529
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	03	405125	746148
ක්ෂය හා ක්‍රම ක්ෂය		234806	255190
වෙනත් වියදම්	04	2241471	838674
මූල්‍ය පිරිවැය(බැංකු ගාස්තු)		350	4569
		24292394	21527110
කාලච්ඡේදය සඳහා ඌනතාවය/ අතිරික්තය		(1719379)	(141689)
		(1719379)	(141689)

මෙම මූල්‍ය ප්‍රකාශනය , සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

ලේඛාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාව	සභාපති හෝමියෝපති වෛද්‍ය සභාව	කමිටු සාමාජික හෝමියෝපති වෛද්‍ය සභාව	සකස් කළේ කේ.එස්. පියසිරි විශ්‍රාමික ප්‍රධාන ගණකාධිකාරී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

Dr.D.M.Ashan Thilanka
President
Homoeopathic Medical Council

විස්තරය	2020 රු.	2019 රු.
සටහන් 01		
වෙනත් අය භාර		
වාර්ෂික ගාස්තු	7200	10450
විවිධ ලැබීම්	4000	10250
	11200	20700
සටහන 02		
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	18591492	17129036
සේවක අර්ථසාධක අරමුදල්	2229416	2042796
සේවා නියුක්ති භාර අරමුදල්	557355	510697
අතිකාල වියදම්	32379	-
	21410642	19682529
සටහන 03		
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය වියදම්	3318	8007
සංග්‍රහ වියදම්	8957	22775
ඖෂධ බහාලුම් හා ඖෂධ බහාලුම්		532000
කවර පාරිභෝජනය	392850	183366
	405125	746148
සටහන 04		
වෙනත් වියදම්		
ගණකාධිකාරී ගාස්තු	42000	42000
විගණන ගාස්තු	50000	200733
දුරකථන ගාස්තු	45654	62509
ඝායන වියදම්	48474	44935
විදුලි ගාස්තු	103419	97010
ජල ගාස්තු	48178	80080
ගමන් වියදම්	18064	79617
තැපැල් වියදම්	6215	15185
මුද්‍රණ වියදම්	173575	23718
විවිධ වියදම්	46616	4825
භාෂා පරිවර්ථන ගාස්තු	5598	60715
සභාපති දීමනා	260000	-
වෛද්‍ය සහා රැස්වීම් දීමනා	132000	-
පාරිතෝෂික දීමනා	1156678	-
වර්ජනම්	-	2000

නීති ගාස්තු	105000	113500
අලුත් වැඩියා වියදම්	-	11847
	2241471	838674

සටහන් අංක 05

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති (2009) අංක 01 ට අනුවය. එසේම එහි ''ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑ'' යන පරිදි ඉදිරිපත් කර ඇත.

සටහන් අංක 06

2020 වර්ෂය සඳහා විභාග ගාස්තු වෙන් කර ඇත.

සටහන් අංක 07

පාරිතෝෂික සඳහා වෙන්කිරීම

2020 වර්ෂය සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ නිලධාරීන්/සේවකයින් දහසය දෙනෙකු සුදුසුකම් ලැබ ඇත.

සටහන් අංක 08

හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්ථන හා මූලධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනයන් සභාවට ලැබුණු ප්‍රතිපාදනයන් ලෙසත් එසේම එම ප්‍රතිපාදනයන් ගෙන් දරණු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සළකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

සටහන් අංක 09

2019 වර්ෂයේ වරිපනම් සඳහා වෙන් කිරීම් කලද, වරිපනම් සඳහා 2019 හා 2020 වර්ෂවලට අදාළව බැරකම් ඉදිරිපත් වී නොවුනු නිසා 2020 වර්ෂය සඳහා වරිපනම් වෙනුවෙන් මුදලක් වෙන් නොකරන ලදි.

හෝමියෝපති වෛද්‍ය සභාවේ
2020 දෙසැම්බර් 31 දිනන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
ලැබීම්,			
රජයෙන් ලද පුනරාවර්තනය ප්‍රදාන		22482797	21273216
බැංකු පොලී		79018	91505
වෙනත් ලැබීම්	(1)	11200	20700
		22573015	21385421
ගෙවීම්			
සේවක පිරිවැය	(2)	21419143	19740807
බැංකු ගාස්තු		350	4569
වෙනත් ගෙවීම්	(3)	1063654	1532409
		22483147	21277785
ශුද්ධ මුදල් ප්‍රවාහය.		89868	107636
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්			
රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය		885892	-
දේපල පිරියත හා උපකරණ සඳහා		(885892)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		-	-
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩි වීම	04	89868	107636
කාලච්ඡේදයේ ආරම්භයෙදී වූ මුදල් හා මුදල් සමාන දෑ	05	2511862	2404226
කාලච්ඡේදය අවසානයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ	06	2601730	2511862

මෙම මූල්‍ය ප්‍රකාශනය , සකස්කිරීම සහ ඉදිරිපත් කිරීම වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

ලේඛාධිකාරී	සභාපති	කමිටු සාමාජික	සකස් කළේ
ඩී. ඒ. පෙරේරා ලේඛාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාව අංක. 94, වැලිසර.	Dr.D.M.Ashan Thilanka President Homoeopathic Medical Council		

විස්තරය	2020 රු.	2019 රු.
සටහන් 01		
වෙනත් ලැබීම්		
වාර්ෂික ගාස්තු	7200	10450
විවිධ ආදායම්	4000	10250
	11200	20700
සටහන 02		
සේවක පිරිවැය		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	18599992	17182827
සේවක අර්ථසාධක අරමුදල්	2229417	2046384
සේවා නියුක්ති භාර අරමුදල්	557355	511596
අතිකාල වියදම්	32379	-
	21419143	19740807
සටහන 03		
අනෙකුත් ගෙවීම්		
විගනන ගාස්තු	77400	185584
දුරකථන ගාස්තු	42814	64254
විවිධ වියදම්	6366	4825
විදුලි ගාස්තු	103625	96031
ජල ගාස්තු	53579	69315
ගමන් වියදම්	9950	57623
තැපැල් ගාස්තු	6215	15185
මුද්‍රණ ගාස්තු	173575	23718
ලිපි ද්‍රව්‍ය	3318	8007
සංග්‍රහ වියදම්	8957	22776
පරිවර්ථන ගාස්තු	2635	60715
සභාපති දීමනා	260000	-
වෛද්‍ය සහා රැස්වීම් දීමනා	132000	-
අලුත් වැඩියා වියදම්	-	11847
වරිපනම්	-	-
නීති ගාස්තු	105000	113500
ඖෂධ බහාලුම් මිලට ගැනීම්	-	532000
ඖෂධ කවර මිලට ගැනීම්	-	183366
සායන වියදම්	36220	41663
ගණකාධිකාරී ගාස්තු	42000	42000
	1063654	1532409

සටහන 04		
මුදල් හා මුදල් සමාන දෑ		
වර්ෂය අවසාන මුදල් ශේෂය	2601730	2511862
වර්ෂය ආරම්භක මුදල් ශේෂය	2511862	2404226
	89868	107636

	සටහන්	2020 රු.	2019 රු.
සටහන 05			
කාලඡේද ආරම්භයට දිණ මුදල් හා මුදල් හා සමාන දෑ			
කොමර්ෂල් බැංකුව		1874489	1787553
ලංකා බැංකුව		441473	420773
ලංකා බැංකුව(රාජගිරිය)		195900	195900
		2511862	2404226
සටහන 06			
කාලඡේද අවසානයට වූ මුදල් හා මුදල් හා සමානදැයි			
කොමර්ෂල් බැංකුව		1953157	1874489
ලංකා බැංකුව		452673	441473
ලංකා බැංකුව(රාජගිරිය)		195900	195900
		2601730	2511862
		89868	107636
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්තය/ඌනතාවය, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමග සැසඳීම			
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්තය/ඌනතාවය		(1719379)	(141689)
මුදල් නොවන වෙනස් වීම්- ක්ෂය වීම්		234806	255190
ගෙවිය යුතු වැය වැඩි වීම		1181591	(5865)
තොගයේ වෙනස් වීම්(තොගය අඩුවීම්)	07	392850	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
		89868	107636
සටහන .07			
2020 1:1 ඩප්පි හා කවර තොග ගිණුම් ශේෂය		408651	
2020/12/31 ඩප්පි හා කවර තොග ගිණුම් ශේෂය		15801	
තොගයේ අඩුවීම		392850	

හෝමියෝපති වෛද්‍ය සභාව

ස්කන්ධය වෙනස් වීම (සංචිත) 2020	රු
2020.01.01 දිනට ප්‍රාග්ධන ගිණුමේ ශේෂය	2562144
2020.01.01 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන ගිණුමේ ශේෂය	7502334
2020 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම්	885892
පෙර වර්ෂයේ ගැළපුම් ගිණුම	(30416)
සමුච්චිත ඌනතාවය/අතිරික්තය	(2688452)
2020.12.31 දිනට ශේෂය	8231502

2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර රු.	බැර රු.
කොමර්ෂල් බැංකුව	1953157	
ලංකා බැංකුව	452673	
ලංකා බැංකුව(රාජගිරිය)	195900	
වෙනත් උපකරණ	1450	
පිරියත උපකරණ	4686042	
ක්ෂය වෙන් කිරීම		2163568
ගෙවිය යුතු විගනන ගාස්තුව		151610
ගෙවිය යුතු ගණකාධිකාරී ගාස්තුව		42000
ගෙවිය යුතු දුරකථන ගාස්තුව		6835
ගෙවිය යුතු විදුලි ගාස්තුව		5180
ගෙවිය යුතු ජල ගාස්තුව		14892
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා		1997328
ප්‍රාග්ධනය		2562144
රජයේ මූලධන ප්‍රතිපාදන (සංචිත)		8388226
සමුච්චිත ඌනතා /අතිරික්තතා	969073	
පෙර වර්ෂයේ ගැළපුම් ගිණුම	30416	
පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රතිපාදන		22482797
වැටුප් හා දීමනාවන්	18591492	
ගෙවිය යුතු වෙනත් වියදම්		36805
අර්ථසාධක අරමුදල්	2229416	
සේවා නියුක්ති භාර අරමුදල්	557355	
දුරකථන වියදම්	45654	
විදුලිය වියදම්	103419	
ජල ගාස්තු	48178	
වරිපනම්	-	
ඝායන වියදම්	48474	
ලිපිද්‍රව්‍ය වියදම්	3318	
ගමන් වියදම්	18064	
සංග්‍රහ වියදම්	8957	
විවිධ වියදම්	46616	
තැපැල්/වියදම්	6215	
මුද්‍රණ ගාස්තු	173575	
නීති ගාස්තු	105000	

පරිවර්තන ගාස්තු	5598	
ගෙවිය යුතු සායනික වියදම්		17371
බැංකු පොලී		79018
ව්‍යාපෘති ගාස්තු		7200
විවිධ ආදායම්		4000
වාර්ෂික ක්ෂය	234806	
විගණන ගාස්තු	50000	
ගණකාධිකාරී ගාස්තු	42000	
බැංකු ගාස්තු	350	
ගෙවිය යුතු වරිපනම්		2000
ඖෂධ බහාලුම් හා කවර වියදම	392850	
ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	5407281	
පාරිතෝෂික දීමනා	1156678	
අතිකාල වියදම්	32379	
සභාපති දීමනා	260000	
වෛද්‍ය සභා රැස්වීම් දීමනා	132000	
ඖෂධ බහාලුම් කවර තොග ගිණුම	15801	
ගෙවිය යුතු පරිවර්ථන ගාස්තු		2963
ගෙවිය යුතු විවිධ වියදම්		40250
	38004187	38004187

11. විගණන වාර්තාව

2016 අංක 10 දරණ හෝමියෝපති පනත අනුව පත් කෙරුණු හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018 ඔක්තොම්බර් 19 දිනෙන් අවසන් වූ පසු 2020 සැප්තැම්බර් 09 වන දින නව වෛද්‍ය සභාව පත්වන ලදී. නව වෛද්‍ය සභාව යටතේ හෝමියෝපති ක්ෂේත්‍රයේ දියුණුවට සහ ජනතාවගේ සෞඛ්‍ය නංවාලීම සහ පෙර විගණනය මඟින් පෙන්වා දී තිබූ ගැටළු විසඳාලීම සඳහා සුවිශේෂී තීරණ රැසක් සිදු කරන ලදී. වෛද්‍ය සභාවට අනුමත ගිණුම් අංශයක් නොතිබුණු බැවින්, වෛද්‍ය සභාවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෙම වසරේදී ද සභාවේ ගිණුම් කටයුතු සිදුකරනු ලැබුවේ දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය මඟිනි. කෙසේ වෙතත් වෛද්‍ය සභාවක් නොමැති කාලයේ අතපසු වී තිබූ බොහෝ කාර්යයන් සහ කාර්යාලීය වැඩකටයුතු මඟ හරවා ගැනීම සඳහා අභිනවයෙන් පත් වූ වෛද්‍ය සභාව කඩිනමින් ක්‍රියා කළ බව සඳහන් කළ යුතුය. මෙම වසරට අදාළව සකස් කෙරුණු සහ සම්මත වූ අවසන් ගිණුම් වාර්තා, මේ සමඟ ඉදිරිපත් කෙරේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනයේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාව මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.



වෛද්‍ය ඩී. එම්. අෂාන් තිලංක
සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එච්එස්එම්/බී/එච්එම්සී/එෆ්ඒ/2020/02

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 අගෝස්තු 13 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

✓ සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සහාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සහාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) ඡේදය	නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමේ දින සිට දින තිහක් ඇතුළත පාරිතෝෂිකය ගෙවිය යුතු වුවද, 2020 මැයි 15 දින සේවයෙන් ඉල්ලා අස්වී තිබුණු ඖෂධ සංයෝජකයෙකු ලෙස වර්ෂ 5 ක් සේවය කළ නිලධාරියෙකුට 2020 දෙසැම්බර් 31 දින වන විටත් රු.77,205 ක් වූ පාරිතෝෂිකය ගෙවා නොතිබුණි.

(ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ

(i) 28 (6) උප වගන්තිය	හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තුව හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ii) 30 වගන්තිය	හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්විය යුතු වුවද, විභාගය පැවැත්වීම සඳහා වූ නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු විභාගය, 2021 ජුනි 30 දින වන විටත් පැවැත්වීමට නොහැකිවීමෙන් වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ප්‍රමාදවී තිබුණි.
(iii) 31(1) උප වගන්තිය	හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 133	සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 751	ආයතනයට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛණ පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, 2018 වර්ෂයේදී රු.644,634 කට මිලදීගත් හා සමාලෝචිත වර්ෂයේදී රු.885,892 කට මිලදීගත් භාණ්ඩ, පොදු ද්‍රව්‍ය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

(iii)	මුදල් රෙගුලාසි 754	සෑම මුදල් වර්ෂයකම අවසානයේ බඩු ලේඛන පොත තුලනය කළ යුතු වුවද, 2019 වර්ෂයේ සිට පොදු ද්‍රව්‍ය ලේඛනය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනය තුලනය කර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 756	ආයතනයේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවත් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර හාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ඇ)	ආයතන සංග්‍රහයේ IIපරිච්ඡේදයේ 16.1 වගන්තිය	කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම සඳහා වූ විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවත්, 2012, 2014 හා 2015 වර්ෂවලදී බඳවාගෙන තිබුණු තනතුරු 04 කට අදාළ නිලධාරීන් 20 දෙනෙකු වෙනුවෙන් 2021 ජුනි 30 දින වන විටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථීර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි.
(ඉ)	2018 නොවැම්බර් 14 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවද, 2009 වර්ෂයේදී අයකර තිබුණු රු.1,204,500ක් වූ පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,953,157 ක් විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතකර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

(ආ) මහජන මුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියකින් තොරව "හෝමියෝපති අරමුදල" නමින් එකක් රු.5,000ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණි. මුද්‍රණය කළ වර්ෂය, මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 159ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.795,000 ක් විය. ඉන් පොත් 416 ක තොගයක් ඉතිරිව පැවතුණු අතර 2021 ජූලි 15 දින වන විටත් එම ආධාර පත්‍ර පොත් අවලංගු කිරීමට හෝ අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු.1,199,254 ක ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2021 ජූලි 15 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 12 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යමණ්ඩලය 48 ක් වුවද තථ්‍ය කාර්යමණ්ඩලය 37 ක් විය. සභාව සඳහා අත්‍යවශ්‍ය තනතුරුවන වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු හා ඖෂධ සංයෝජකවරු 08 දෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට 2021 ජූනි 30 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

සුභාශිංසන

★ ★ ★ ★

ගරු දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා

ලේකම් සහ අතිරේක ලේකම්වරියන්

හෝමියෝපති වෛද්‍ය සභාවේ සභාපති ඇතුළු

සාමාජිකයන් / සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය